# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2014/15
2019 පෙබරවාරි - අප්‍රේල්
මානවශාස්ත්‍ර පීඨය

## බටහිර සම්භාව්‍ය සංස්කෘතිය

### ග්‍රීක රෝම සාහිත්‍යය WCCU - E 3015

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. හීසියඩ්ගේ වීරකාව්‍ය ලක්ෂණ භාවිතය ඔහු කවියෙකු වශයෙන් දක්වන නිපුණතාවය මෙන්ම ඔහු කෘෂිකර්මය පිළිබඳ දැනුවත්භාවය කෙසේ පිළිබිඹු කරයි ද? ද වර්ක්ස් ඇන්ඩ් ඩේස් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

02. ද ජෝර්ජික්ස් හි වර්ජිල් හි කෘෂිකර්මය පිළිබඳ උපදෙස් තමාගේ ජාත්‍යානුරාගී හැඟීම් සමඟ කොතරම් සාර්ථක ලෙස මුසු කරයි ද යන්න අගයන්න.

03. ද හිස්ටරීස් හි ඉතිහාසය ලිවීමෙහිලා වීරකාව්‍ය සම්ප්‍රදාය කුමන බලපෑමක් කර ඇත්ද? විවිධ දේශයන් හා චරිත පිළිබඳ හෙරඩෝටස්ගේ විස්තරය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

04. ඇතන්ස් හා ස්පාටා අතර ගැටුම අදාළ ඓතිහාසික සාක්ෂි කලා කෘතියක් ඉදිරිපත් කිරීමෙහිලා තියුසිඩීසීස් කෙසේ භාවිතා කරයිද? ද හිස්ටරි ඔෆ් ද පෙලපනීසියන් වෝ ඇසුරෙන් සාකච්ඡා කරන්න.

05. ද ඇනල්ස් ඔෆ් ඉම්පීරියල් රෝම් හි තමා නිරූපණය කරන ඓතිහාසික චරිතයන්හි අධිරාජ්‍යවාදී බලයට ඇති ආශාවේ විනාශකාරී ස්වභාවය ඉදිරිපත් කිරීමෙහි ලා ටැසිටස් දක්වන සාහිත්‍යමය කුසලතාවය සාකච්ඡා කරන්න.

06. තත්කාලීන රෝම සමාජයේ සදාචාරාත්මක අගයන්ගේ බිඳ වැටීම පිළිබිඹු කරන කෘතියක් ලෙස ජුවෙනල්ගේ ද සික්ස්ටීන් සැටයර්ස් සාකච්ඡා කරන්න.

07. ග්‍රීක වීරකාව්‍ය සම්ප්‍රදාය රෝම ගත්කතුවරුන්ට කුමන ආලෝකයක් විහිදුවයිද? ඔබ හදාරා ඇති රෝම සාහිත්‍ය කෘතීන්ගේ විෂය ක්ෂේත්‍රය හා චරිත ඇසුරෙන් සාකච්ඡා කරන්න.

08. පහත සඳහන් මාතෘකාවන්ගෙන් දෙකකට (02) කෙටි සටහන් ලියන්න.

(අ) ඉතාලියානු ගැමි පරිසරය

(ආ) මෙසලිනා

(ඇ) පර්සීස්

(ඈ) තියුසිඩිඩීස් හි කථා පැවැත්වීම

(ඉ) ජුවෙනල් හි සමලිංගිකත්වය

*************************